# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1724/8 - 2011 සැප්තැම්බර් 22 වැනි බ්‍රහස්පතින්දා - 2011.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04.

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත්කිරීම් ආදිය

ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ සුමිත් සුරවීර මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් සභාවේ සභා ලේකම් වශයෙන්,

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ කේ. ඩී. සිරිසේන මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් සභාවේ යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බල ශක්ති සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ කේ. ඩී. සිරිසේන මහතා තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සභාවේ සභා ලේකම් තනතුරට පත් කර ඇති සුමිත් සුරවීර මහතා එම තනතුරේ සේවයට වාර්තා කරන තෙක් ඌව පළාත් සභාවේ සභා ලේකම් තනතුරේ වැඩ බැලීමට,

04. ඌව පළාත්, පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩබලන එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ මහතා 2011.08.07 දින සිට 2011.10.29 දින දක්වා විදේශ ගත වන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ ගුණදාස සමරසිංහ මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත්, පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

05. ඌව පළාත් සභාවේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ මහතා 2011.08.07 දින සිට 2011.10.29 දින දක්වා විදේශ ගත වන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. සී. හෙන්නායක මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් සභාවේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීමට,

1A - PG 001288—380 (2011/09)

06. විශ්‍රාමික නිලධාරි ඒ. එම්. වික්‍රමසිංහ මහතා 2011.08.05 වැනි දින සිට 2012.08.04 වැනි දින දක්වා බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එස්. සී. වීරකෝන් මහතා 2011.08.08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් තනතුරේ වැඩ බැලීමට,

08. විශ්‍රාමික නිලධාරි ආර්. එම්. පුංචි සිංඤ්ඤෝ මහතා 2011.07.21 දින සිට 2011.12.31 වැනි දින දක්වා හපුතලේ නගර සභාවේ සභා ලේකම් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

09. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ II වැනි පන්තියේ ආර්. ටී. එස්. එල්. ජයසිංහ මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව 2011.08.22 දින සිට බණ්ඩාරවෙල මහා නගර සභාවේ ගණකාධිකාරි තනතුරේ වැඩ බැලීමට,

10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ජී. ඩබ්. සී. එස්. ප්‍රියභාෂිණි මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව 2011.08.22 දින සිට බණ්ඩාරවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් වශයෙන් රාජකාරි ඉටු කිරීමට,

11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරි කේ. ඒ. පෙරේරා මහතා, ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුරේ රාජකාරිවලට අමතරව, 2011.08.02 දින සිට ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු සහ වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2011.12.31 දින යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක්, මෙම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත වැඩ බැලීමට.

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2011 සැප්තැම්බර් මස 16 වැනි දින,
බදුල්ල,
රජ වීදියේ පිහිටි,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

09-130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.